පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

දෙවන වාරය- ජූනි මාසය - සතිය - 01

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

# උඩරට නර්තන සම්ප්‍රදාය.

School Department of Education, Sabaragamuwa Province/ Weekly School

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. (වෛරොඩි වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේ දි උගත් වෛරොඩි වන්නමේ බෙර පදය තාල තබන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න.

තුන්වන පියවර : දැන් එම කවි ගායනා කරමින් වන්නම නර්තනය කරන්න.

හතරවන පියවර : මෙම වන්නමට අදාල කස්තිරම සීරුමාරුව හා අඩව්ව තාල තැබීමට උත්සාහ කරන්න. (පාඩම් කරන්න)

වෛරොඩි වන්නම : මාත්‍රා 3 තනි තිත

බෙරපදය : ජිං ගත ගොගෙ

තානම - තනෙන තනෙන තනෙන තනා - තානාතෙයි තානාතෙයි තානාතෙයි තනා
තනෙන තනා තානාතෙයි තනා - තානත්තෙයි තන තම්දන -තම්ද නා තම්ද නා
නා

(1) කවිය - අගය වඩන කවි වරුණා - රගය දැනෙයි කළ රචනා
මට උරණා නොව මේදිනා - මහතුගෙ අවසර රැගෙන සමාවා

(2) කවිය - ඉසුරු දෙවිඳු වඩින දිනා - කෙහෙතු විමන දැක නෙතිනා
එම විමනා දෙව් වඩිනා - කෙහෙතු ද දැක කොයි වඩිති කමාවා

(3) කවිය - විමන සමග කෙහෙතු දනා - ඉසුරු දෙවිඳු තුති දෙමිනා
එම වරුණා කළ යෙහෙනා - පාතල වෛරොඩි වන්නම මේවා

(4) කවිය - ඔබින මෙසබ තුළ පැමිණා -කවිය නැති ව බොරු වරුණා
කළ දුදනා නැත ඔබිනා - උගතුගෙ බල වැඩි මොකද පමාවා

කස්තිරම - රුදගත ගත ගත කුකුදත් - ගජිංත ගත් ජික් කුංදත්
කුකුඳ ගජිං කුකුඳ ගජිං තකුද තකට ගත කුද කුද
ගජිංත ගත් ජික්කුංදත් ජිකුතක තරිකිට කුංදත් තා

සීරුමාරුව- තකට දොදොම් තා කඩතක තරිකිට තකට දොදොම් තා

අඩව්ව - ගත්ත තෙහිගු තකට තකුඳ - තක්කඩ ජික්කඩ තරිකිට
තකට තකුඳ ගතකු තෙහිගු තකට තකුඳ
තත් තත්කඩ තරිකිට - ජිත් ජිත්කඩ තරිකිට - තොං තොංකඩ තරිකිට තං

| | |
|---|---|
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල | |
| විෂය - නර්තනය | දෙවන වාරය- ජූනි මාසය - සතිය - 01 |
| ශ්‍රේණිය - 9 | සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා<br>ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන. |
| **පහතරට නර්තන සම්ප්‍රදාය.** | |

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. (ඊශ්වර කුණ්ඩතාලය වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේ දි උගත් ඊශ්වර කුණ්ඩතාල වන්නමේ බෙර පදය තාල තබන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න.

තුන්වන පියවර : දැන් එම කවි ගායනා කරමින් වන්නම නර්තනය කරන්න.

හතරවන පියවර : මෙම වන්නමට අදාල ඉරට්ටිය තාල තැබීමට උත්සාහ කරන්න. (පාඩම් කරන්න)

**ඊශ්වර කුණ්ඩතාල වන්නම**

බෙර පදය - දො දොං දොං ගදිකිට ගදිත දොදොංතා

තානම - තෙනා තෙන තෙන තෙම් තෙනෙන තෙන තෙනා

කවිය - කිපී ලොව දිළෙන තෙද තිලොනිඳුගේ
හැපී දුක් රැසින් උන් සත ගොස් නොලගේ
පිපී වත කමල් විල තඹර තික ලගේ
නොපී නනු කවුද වෙනු සරණ රැස් ගගේ

ඉරට්ටිය - දොම්කත තදිකින තරිකිට ගත ගුගුදම්
ගුගුදිත්තා ගත දොහොකඩ තහකඩ දිත්
තරිකුම් දිරිකුම් ගුගුදම්.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

ශ්‍රේණිය - 9

දෙවන වාරය- ජුනි මාසය - සතිය - 01

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

# සබරගමු නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. ( කදම්භ පක්ෂී වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේ දී උගත් කදම්භ පක්ෂී වන්නමේ බෙර පදය තාල තබන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න.

තුන්වන පියවර : දැන් එම කවි ගායනා කරමින් වන්නම නර්තනය කරන්න.

හතරවන පියවර : මෙම වන්නමට අදාල කලාසම හා අඩව්ව තාල තැබීමට උත්සාහ කරන්න.
(පාඩම් කරන්න)

තාල රූපය : මාත්‍රා 3 තනි තිත (මැදුම් තනි තිත)

දවුල් පදය : ජිං ගතත් ගතත් ගතකුද
ජිංත ජිං තරිකිට ජිං තරිකිට තක

තානම : තම්දනත් තනත් තන තම් දන තානා තනෙන
තෙයි තනත් තනත් තන තම් දන තා- නා

කවිය : වත් පසත් ලෙසින් බබළන මෙන් නා - නා ලිය
ගත් කැළුම් නොමින් නිබදව විහිදීමා
සිත් තොසින් ගොසින් ගිරි කුළ ගොස් යානා වෙත
පත් වෙමින් ගොසින් විල් අසලක සේමා

සිත් තොසින් පසන් කොවුලිඳු රුක් සෙවණැලි තුළ
ගත් තුඩින් නෙළා පල රස වැලඳීමා
මෙත් සිතින් අසන් වියතුනි දෙසවන් දී
මෙම කදම්බ පක්ෂී වන්නම රඟ මෙහෙමා

කලාසම - ජිංත කුකුඳ තා තකට
ජිංත කුකුඳ තා තකට
ජිංත කුකුඳ ගතිත කුකුඳ
ජිංත කුකුඳ තා ගතත්.

අඩව්ව - ජෙංත තකට දිරිකිට තරිකිට ගතත් ගත කුද ගත ගතත්
ජෙජෙං තත් කිත්තත් කිතත් ජෙජෙං තා
කුන්දත්තරිකිට ගතත් කුකුඳ තා